# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2248/5 - 2021 ඔක්තෝබර් මස 04 වැනි සඳුදා - 2021.10.04

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

මගේ අංකය: කඩු/ඉඩම්/03/145/යූඩීඒ.
ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය: 4-3/11/2016/UDA/452.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම්/පරවශතාව ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ, මෙයින් දැනුම් දී සිටිමි.

ලබා ගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ/පරවශතාවේ විස්තර :-

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කඩුවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 477, තලංගම උතුර A ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, තලංගම උතුර ගම තුළ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද කො. 9904 දරන මූලික පිඹුරෙහි කැබලි අංක 1 වශයෙන් පෙන්නුම් කරන ප්‍රමාණයෙන් හෙක්. 0.0276ක් වූ පහත විස්තර කෙරෙන ඉඩම් කැබැල්ල (01):

01. කැබලි අංක 01
ඉඩමේ නම: සොයාගත නොහැක; ඉඩම් පරිහරණය: ගෙවත්ත; හිමිකම් කියන්නා: රජය; මුල් හිමිකම් කියන්නා: සොයාගත නොහැක; ප්‍රමාණය: හෙක්. 0.0276

ඉහත සඳහන් ඉඩමට/පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2021 ඔක්තෝබර් මස 27 දින, පෙ. ව. 9.00ට කඩුවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තව ද, 2021 ඔක්තෝබර් මස 20 වැනි දිනට මත්තෙන්, ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම/පරවශ්‍යතාවය ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුය. හිමිකම් පෑමට සහාය වන සියළුම ඔප්පු හා වෙනත් ලියවිලි පරීක්ෂණයේ දී ඉදිරිපත් කළ යුතු ය.

කේ. චතුර මිහිඳුම්,
ප්‍රාදේශීය ලේකම්,
කඩුවෙල.

2021 ඔක්තෝබර් මස 01 වැනි දින,
කඩුවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

10 - 175

1A - G 35028 – 33 (2021/10)

මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

**ශුද්ධිපත්‍රිකාව**

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**
7 වැනි වගන්තිය යටතේ දැන්වීම

ප්‍රාදේශීය ලේකම් යොමු අංකය: 6/3/7/15/26.
ඉඩම් අමාත්‍යාංශයේ අංකය: 4/3/9/2105 MV /325.

ඉඩම් අත්කර ගැනීමෙ පනතේ 7 වන වගන්තිය යටතේ 2244/11 හා 2021.09.08 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රයේ 2A පිටුවේ සඳහන් අවසාන භූ ලක්ෂණාත්මක පිඹුරු අංකය 17, අතුරු පිඹුරු අංකය 39, පත්‍රය 101 දරන සැලසුමේ “අතුරු පිඹුරු අංක 39’’ ලෙස සඳහන් වුවත් එය “අතිරේක අංක 39” වශයෙන් හා ග්‍රාම නිලධාරි වසම “මාරාගමුව’’ ලෙස සඳහන් වුවත් එය “පුබ්බිලිය” ග්‍රාම නිලධාරි වසම ලෙස සංශෝධනය විය යුතු බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

චින්තක ඉලංගසිංහ,
ප්‍රාදේශීය ලේකම්,
නාඋල.

2021 ඔක්තෝබර් මස 01 වැනි දින,
නාඋල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

10 - 176

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.